1669

MO - ~

25 MAY 2018

වාරිමාර්ග කළමනාකරණ අංශය


නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - නුවරවැව
வதிவிட திட்ட முகாமையாளர் காரியாலயம் – நுவரவெவ
**Resident Project Management Office - Nuwarawewa**

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகாமைத்துவ பிரிவு
Irrigation Management Division
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
Ministry of Irrigation & Water Resources Management

නුවරවැව, යාපනය පාර,
පුලියන්කුලම, අනුරාධපුර
நுவரவெவ, யா
புலியன்குளம், அநுராதபுரம்
Nuwarawewa, Jaffna,
Puliyankulam, Anuradhapura


මගේ අංකය / எனது இல. / My Ref No
ඔබේ අංකය / உமது இல. / Your Ref No
දිනය / திகதி / Date — 2018.05.10

ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම
2018.05.10

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ
සියළුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

## 2018 මැයි මස 10 වන දින විශේෂ ව්‍යාපාර කළමනාකරණ කමිටුව රැස්වීම් වාර්තාව

නුවරවැව නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2018 මැයි මස 10 වන දින පෙ.ව.09.30 ට පමණ ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම නුවරවැව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාවේදි පවත්වන ලදී. පැමිණ සිටි සියලු දෙනා නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමන්ගේ පිළිගැනීමෙන් හා ආගම් සිහි කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**සහභාගී වූ නිළධාරීන්**

1. ඊ.ඩී.එන්.ප්‍රේමචන්ද්‍ර - නේවාසික ව්‍යාපාර කළමණාකරු
2. වයි.කේ.එස්.පී.කුමාරි - ප්‍රාදේශිය නිලධාරි - ගොවිජන සේවා
3. වයි.ඒ.ඒ.එස්.කුමාර - ඉංජිනේරු සහකාර
4. රුවනි ශානිකා - ඉංජිනේරු සහකාර- වාරිමාර්ග දෙපාර්තමේන්තුව
5. මංජුලා බමුණුසිංහ - කෘෂිකර්ම උපදේශක - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
6. එච්.ඒ.එස්.හෙට්ටිආරච්චි - කෘෂිකර්ම උපදේශක - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
7. එස්.ඩබ්.එස්.සෙනෙවිරත්න - සංවර්ධන නිලධාරි
8. ටී.එම්.සී.ප්‍රියදර්ශනී - සංවර්ධන නිලධාරි
9. ඩබ්.එන්.එස්.එස්.ගුණතිලක - සංවර්ධන නිලධාරි
10. පී.ටී.සී.එස්.කුලතුංග - තාක්ෂණ සහයක - වාරිමාර්ග දෙපාර්තමේන්තුව
11. ඩබ්.ආර්.එස්.ඒ.සී.සේනාධිර - කෘ.ප.නි.ස. - ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
12. එන්.පී.චන්ද්‍රසේකර - කෘ.ප.නි.ස. - ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
13. ඩබ්.ඒ.එස්.වසන්තා - කෘ.ප.නි.ස. - ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
14. රේණුකා සෙනවිරත්න -කෘ.ප.නි.ස. - ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**සහභාගී වූ ගොවි නියෝජිතයෝ**

1. ජී.කේ.ටී.මුණසිංහ - ගරු භාණ්ඩාගාරික - D123
2. ටී.ඒ.කුමාරදාස - ගරු භාණ්ඩාගාරික - එකමුතු
3. ඩී.එම්.ගුණවර්ධන - ගරු ලේකම් - එකමුතු
4. එම්.ඒ වීරසිරි - ගරු ලේකම් - විජය
5. ඊ.එම්.තිලකරත්න - ගරු භාණ්ඩාගාරික - මිහිඳු

7. ජේ.ජී.රාජරත්න - ගරු සභාපති- සාරභූමි
8. ජී.ඩබ්.ජී.ලක්ෂ්මන් සරත් කුමාර - ගරු භාණ්ඩාගාරික -ජයවැව
9. ටී.එම්.අබේසිංහ - ගරු භාණ්ඩාගාරික - ජයවැව
10. ආර්.එම්.ජයවර්ධන - ගරු ලේකම් - සාලිය
11. එච්.ටී.ජිනදාස - ගරු සභාපති - රංකොත
12. එස්.එම්.ඒකනායක - ගරු ලේකම් - රංකොත
13. එස්.එම්.හේරත් බංඩා - ගරු සභාපති - එක්සත්
14. ප්‍රභාත් සිසිර කුමාර - ගරු භාණ්ඩාගාරික - එක්සත්
15. එස්.එච්.එස්.පී.ජයලත් - ගරු භාණ්ඩාගාරික -පැරකුම්
16. එම්.ජී.පෙරේරා - ගරු ලේකම් - පැරකුම්
17. කේ.පී.සෝමපාල - විජය
18. ජේ.ජී.කරුණාදාස - උප ලේකම් - විජය
19. යූ.එච්.විජිත සිල්වා - ගරු ලේකම් - ජයවැව
20. ඩබ්.එම්.එස්.වික්‍රමසිංහ - ගරු භාණ්ඩාගාරික - පරාක්‍රම
21. කේ.එච්.ෆ්‍රැන්සිස් - ගරු සභාපති - විජය
22. ආර්.එම්.කපිල රත්න - සාමාජික - D123
23. පී.බී.අශෝක - සාමාජික - D123
24. කේ.ජී.නිලන්ත - ජලපාලක - පැරකුම්
25. පී.ජී.තිලකනායක - ජලපාලක - සාරභූමි

<u>ලිපි ඉදිරිපත් කිරීම</u>

ලංකා බැංකුව මගින් කුරුළු දිවිය ණය වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම පිළිබඳව ලිපිය හා ප්‍රධාන ඇළ හරහා ඉදිකර ඇති පාලම් හේතුවෙන් රොන්මඩ ඉවත් කිරීමේදී එම කටයුත්ත නිසියාකාරයෙන් සිදු නොවීම පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම පිළිබඳ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

ආයතන සංවර්ධන - එස්.ඩබ්.එස් සෙනවිරත්න මයා

| කාරණය | ප්‍රගතිය |
|---|---|
| කාරකසභා | 85% |
| මහසභා<br>නිළවරණ | 03<br>- |

ගොවි සංවිධාන වල විගණන කටයුතු සිදුකල යුතු බවත් සාලිය,ජයවැව.D123,විජය,මිහිඳු යන ගොවි සංවිධාන වල නිලවරණ කටයුතු ඉදිරියේ දී සිදු කල යුතු බව සඳහන් කලේය.

<u>වාරිමාර්ග කටයුතු-ඉංජිනේරු සහකාර - වයි.ජී.ජී.එස් කුමාර මහතා</u>

ජලධාරිතාවය - අඩි 12 අඟල් 7
අක්කරඅඩි - 12370
නාච්චාදූව ජලාශයෙන් දැනට අක්කර අඩි 2000 ක් ලැබී ඇති බවත් තවත් අක.අඩි 500ක් ඉදිරියේදී ලැබෙන බවත් සඳහන් කලේය.වැවට ජලය නොලැබුනහොත් වගාකරන බිම් ප්‍රමාණය වැඩිකල නොහැකි බවත් කලෝමීටර් 17ක් පමණ ප්‍රධාන ඇලේ ජලය ගෙන යා යුතු අතර ජල මට්ටම අඩි 8 දක්වා අඩු වූ විට පහලට ජලය ගෙනයාම අපහසු බවත් සඳහන් කරන ලදී.තවද ඉදිරියේදී මෙවැනි තීරණ ගැනීමේදී මේ පිළිබඳව අවධානය යොමුකළ යුතු බව වැඩි දුරටත් දන්වා සිටින ලදී.

| ගො.සංවිධානය | ගැටලුව | තීරණය | වගකීම |
|---|---|---|---|
| ජේ.ජී.රාජරත්න මහතා සාරභූමි ගොවි සංවිධාන සභාපති | කානියන්කඩවල වැව් බන්ඩිවකේ වලවල් සෑදී ඇතිබව | ගොවි සංවිධානය මගින් නඩත්තු කටයුතු සිදුකරගත යුතු බව | වා.මා. |

**<u>කෘෂිකර්ම කටයුතු - කෘෂිකර්ම උපදේශක - මංජුලා බමුණුසිංහ මිය</u>**

මෙම කන්නය සඳහා මාස 2 ½ හා 3 වී වගා කිරීම සුදුසු බවත් ප්‍රමාද වී වගා කිරීමෙන් රෝග වැලදීමේ ප්‍රතිශතය වැඩි නිසා බීජ සඳහා වැපිරීමට පෙර ග්ලවවර් යොදා ගැනීම සුදුසු බව දන්වා සිටින ලදී.BG250(මාස 2),BG300(මාස 3),බීජ වී බුසල් එකක් රුපියල් 1750 ක මිලට දෙපාර්තමේන්තුව මගින් ලබා දිය හැකි බව කව දුරටත් දන්වා සිටින ලදී.අතිරේක බෝග වගා කරන ගොවි මහතුන් සඳහා MI 6 වර්ගයේ මුං ඇට කිලෝ 200 ක් 50% දායකත්වය යටතේ (කිලෝ එකක් රු.165) ලබා දිය හැකි බවත් සෝයා බීජ නොමිලේ ලබා දිය හැකි බවත් සඳහන් කරන ලදී.

**<u>ගොවිජන සේවා කටයුතු - කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර - ඩබ්.ආර්.එස්.ඒ.සී.සේනාධීර මිය</u>**

මෙම කන්නය සඳහා වගා කරන ගොවිමහතුන් හට මේ වන විට පොහොර ඉල්ලුම් පත්‍ර නිකුත් කර ඇති බවත් මුදල් එකතු කිරීමෙන් අනතුරුව පොහොර ලබා ගත හැකිබවත් සඳහන් කලේය.සංවිධාන මට්ටමින් පොහොර ගබඩා සඳහා රැගෙන ආ යුතු අතර ඒ සඳහා ප්‍රවාහන ගාස්තුවක් අය කර ගැනීමට සිදුවන බවත් පොහොර ගබඩා කිරීම සඳහා ස්ථානයක් සූදානම් කර ගත යුතු බවත් දන්වා සිටින ලදී.

**<u>ගොවි සංවිධාන ගැටලු ඉදිරිපත් කිරීම</u>**

| ගොවි සංවිධානය | ගැටලුව | තීරණය | වගකීම |
|---|---|---|---|
| එකමුතු ගොවිසංවිධාන ලේකම් ඩී.එම්.ගුණවර්ධන මහතා | වපුරන අවස්ථාවේ මඩ පොහොර අවශ්‍ය අතර පොහොර ලබා ගැනීම කඩිනමින් සිදුවිය යුතු බව. | ගොවි සංවිධාන මගින් මුදල් එකතු කර ලබා දුන් පසු පොහොර ගෙන්වා දෙන බව. | ගො.සේ |

**<u>අදහස් දැක්වීම - නේවාසික ව්‍යපාර කළමනාකරු</u>**

2018.05.08 වැනි දින පැවති ජල පාලන කමිටු රැස්වීමේදී ඉදිරිපත් වූ අදහස් අනුව මෙම කන්නය සඳහා නවත් අක්කර 200 ක් පමණ වගා කල හැකි බව දන්වා සිටින ලදී.එම ඉඩම් අයිතිය ඒකාබද්ධ ගොවිසංවිධානයට ලබා දී ඒ මගින් ගොවිමහතුන් හට බද්දට දිය හැකි බවත් ඒ තුලින් ඒකාබද්ධ ගොවිසංවිධානයේ අරමුදල ශක්තිමත් කර ගත හැකි බවත් අදහසක් ලෙස සභාවට ඉදිරිපත් කරන ලදී.මේ සඳහා විජය ගොවිසංවිධානය තෝරා ගත හොත් අක්කර 300ක් පමණ වගා කල හැකි බව ප්‍රකාශ කලේය.අනතුරුව වැවෙහි පවතින ජල මට්ටමත් සමඟ වගාව සිදු කරන ආකාරය පිළිබඳව ගොවි සංවිධාන වල අදහස් විමසා සිටින ලදී.

**<u>ගොවි සංවිධාන නිලධාරීන්ගේ අදහස්</u>**

| ගොවි සංවිධානය | අදහස් දැක්වීම |
|---|---|
| විජය ගොවි සංවිධාන ලේකම් එම්.ජී.වීරසිරි මහතා | පෙර මහ කන්නයේ වැවෙහි ජල මට්ටම අඩි 11 ½ න් ආරම්භ කර අක්කර 2000 ක් වගා කල බවත් මෙම කන්නයේ ජල මට්ටම අඩි 12.8 ක් පවතින අතර සියලුම ගොවි සංවිධාන වලට මාස 2 ½ වී සඳහා හෝ ජලය ලබා දෙන ලෙස |
| D123 ගොවි සංවිධාන භාණ්ඩාගාරික ජී.කේ.බී.මුණසිංහ මහතා | වී වගාව සඳහා සියලු ගොවි සංවිධාන වලට ජලය ලබා දෙන ලෙසත් වැවෙහි ජල මට්ටම අඩි 11 න් පසු එම ගොවි සංවිධාන සඳහා ජලය ලබා දීම නතර කරන ලෙසත් අවදානම ගොවි සංවිදාන මගින් දරා ගන්නා බව |
| විජය ගොවි සංවිධාන සභාපති කේ.එච්.ෆ්‍රැන්සිස් මහතා | කන්නයේ පවතින අවදානම ගොවි මහතුන් දරා ගන්නා අතර වපුරා අවසන් වූ පසු පැල ගොයමට ජලය ලබා දෙන ලෙස |
| සාරභූමි ගොවි සංවිධාන සභාපති එජ්.ජී.රාජරත්න මහතා | පානියන්කඩවල වැව යටතේ අක්කර 180න් 100 ක් හෝ වගා කිරීමට අවසර ලබා දෙන ලෙස |

අදහස් දැක්වීම - ඉංජිනේරු සහකාර - වයි.ජී.ජී.එස්.කුමාර මහතා

ඉහතින් ඉදිරිපත් වූ අදහස් ක්‍රියාත්මක කිරීමට හැකි නම් එය අගය කරන බවත් වැසි ජලයෙන් උපරිම ප්‍රයෝජන ගත යුතු බවත් සඳහන් කරන ලදි.පසුගිය මහ කන්නයේ අක්කර අඩි 7500 ක් නාච්චාදූව ජලාශයෙන් ලැබුණු නිසා කන්නය අවසානයේ වැවෙහි ජල මට්ටම අඩි 11 ක් ව පැවතුණ බව සඳහන් කලේය.මෙම කන්නය සඳහා ද අක්කර අඩි 5000 ක් පමණවත් වැවට ජලය ලබා ගැනීමට හැකි නම් කන්නය වගා කල හැකි බවක් රාජ්‍ය මට්ටමින් එය සිදු කල නොහැකි අතර ඒ සඳහා විකල්ප මාර්ගයක් පවතීනම් මෙම අදහස් ක්‍රියාත්මක කල හැකි අතර එසේ නොමැතිව ජලය නිකුත් කිරීම පහල ගොවි මහතුන් හට අසාධාරණයක් බවත් සඳහන් කලේය.පවතින ජල මට්ටම අනුව අනිසුන් ගොවිසංවිධාන සඳහා නිකුත් කල හැක්කේ ජලමුර 4 ක් පමණ බව සඳහන් කලේය.

ඒ අනුව වැවේ ජල මට්ටම අඩි 11.6 දක්වා වූ ප්‍රමාණය තුල සියලුම ගොවි සංවිධාන වලට ජලය නිකුත් කරන බවත් ඉන් පසුව පහල මට්ටමේ දී හානියන්කඩවල,රංකෙත,එක්සත් හා D4 යන ගොවි සංවිධාන වලට පමණක් ජලය නිකුත් කරන බවත් ව්‍යාපාර කමිටුවේදී තීරණය විය.එයට සියලුම ගොවි සංවිධාන නියෝජිතවරු එකඟවූයෙන් සභා සම්මත විය.මෙහිදී වර්ෂා ජලය පදනම් කරගෙන බිම් සකසා වැපිරීමේ කටයුතු කල යුතු අතර වගාව පිහිටා වූ පසුව ජලය ලබා දීමට තීරණය විය.තවද ඇලවෙලි වලට හානි කරමින් ජලය ලබා ගතහොත් අදාල ගොවි සංවිධාන වලට විරුද්ධව නීතිමය කටයුතු සිදු කරන බව දන්වා සිටින ලදි.

මෙම තත්වය යටතේ වගාව සඳහා යොමු වීමේ අවධානම රාජ්‍ය නිලධාරීන් විසින් පෙන්වා දුන්නද ඒ සඳහා සභාවේ ගොවි සංවිධාන නිලධාරි සියලු දෙනාගේ කැමැත්ත පල කරන ලදි.

## වගා කාලසටහන

01 . වගා කිරීමට අපේක්ෂිත බෝග වර්ගය - වී,මාස 2 ½ ,3
02. වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය - වී අක් 2600
03.වගා කිරීමට යෝජිත ප්‍රදේශ - සියලු ගොවි සංවිධාන
04 .ජලය නිකුත් කිරීම ආරම්භ කරන දිනය -මැයි 04
05 . ඇල වෙලි සුද්දකිරීමේ අවසන් දිනය
06 . වපුරා අවසන් කළ යුතු දිනය - මැයි 25
07 . මුර ජලය ආරම්භ කරන දිනය - ව්‍යාපාර කමිටුවේ තීරණ පරිදි
08 . අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය - අගෝස්තු 09

09 . ට්‍රැක්ටර් හා උපකරණ යායට ඇතුලත් කළ යුතු දිනය - මැයි 04
10 . ට්‍රැක්ටර් හා උපකරණ යායෙන් ඉවත් කළ යුතු දිනය - මැයි 25
11 . වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය - මැයි 25
12 . අස්වනු නෙලා අවසන් කළ යුතු දිනය - සැප්තැම්බර් 08
13.වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය - සැප්තැම්බර් 08
14. ඇලවල් නඩත්තු කිරීමේ අරමුදල - අක්කර 01 කට රු.600.00
15. වාරි පද්ධතිය හානි කිරීම සඳහා වූ දඩය -වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හානි තක්සේරුවට අනුව ගොවි සංවිධාන විසින්හානි අය කිරීම සිදුවේ.
16. පිදුරු ගිනි තැබීම සඳහා වූ දඩය -අක්කර 01 කුනීකර ඇතිවිට-රු.5000
-අක්කර 01 ගොඩගසා ඇතිවිට -රු.3000
17.වගා රැස්වීම් තීරණ යෝජනා ස්ථිර කිරීම -
අදාළ සංශෝධනයන්ට යටත්ව යෝජනා ස්ථිර කරන ලදි.
යෝජනාව - එච්.බී.ජිනදාස මහතා - රංකෙත සභාපති
ස්ථිර - එස්.එම්.හේරත් බණ්ඩා මහතා - එක්සත් සභාපති

**ඒ.කේ.බී.මුණසිංහ මහතා - D123 භාණ්ඩාගාරික**

අවසන් ජල මුරය අගෝස්තු 14 දක්වා දීර්ඝ කරන ලෙස ඉල්ලීමක් කලේය.

**එම්.ඒ.වීරසිරි මහතා - විජය ලේකම්**

වැපිරීම සඳහා අනෙකුත් ගොවි සංවිධාන සඳහාද ජල මුරයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කලේය.

නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමන් අදහස් දක්වමින් කියා සිටියේ ඉදිරියේදී ව්‍යාපාර කමිටු රැස්වීම සඳහා ගොවි සංවිධාන නිලධාරීන් පමණක් සහභාගි වන ලෙසය. අනතුරුව ඒකාබද්ධ ගොවි සංවිධාන ලේකම්තුමන්ගේ ස්තුති කථාවෙන් අනතුරුව පස්වරු 1 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

.............................
ටී.ඩී.එන්.ප්‍රේමචන්ද්‍ර
නේවාසික ව්‍යාපාර කළමනාකාර
නුවරවැව ව්‍යාපාර

ටී.ඩී.එන්. ප්‍රේමචන්ද
නේවාසික ව්‍යාපාර කළමණාකරු
වාරිමාර්ග කළමණාකරණ අංශය
නුවරවැව ව්‍යාපාර කාර්යාලය
පුලියන්කුලම, අනුරාධපුර.

පිටපත්

1. අධ්‍යක්ෂ, වාරිමාර්ග කළමනාකරණ අංශය - කොළඹ කා/දැ/පි
2. දිස්ත්‍රික් ලේකම් - අනුරාධපුරය කා/දැ/පි
3. අධ්‍යක්ෂ, වත්කම් කළමනාකරණ වාරිමාර්ග දෙපාර්තමේන්තුව - කොළඹ කා/දැ/පි
4. අධ්‍යක්ෂ ආපදා කළමණාකරණ අංශය වාරිමාර්ග දෙපාර්තමේන්තුව - කොළඹ කා/දැ/පි
5. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) අ/පුර කා/දැ/පි
6. කලාප වාරිමාර්ග අධ්‍යක්ෂක - අ/පුර කා/දැ/පි
7. ගොවිජන සේවා සහකාර කොමසාරිස් - අ/පුර කා/දැ/පි
8. ප්‍රාදේශීය ලේකම් - නැ.නු.ප / ම.නු.ප. කා/දැ/පි